**සංස්කරණය/Editor**
අසෝක සුබසිංහ Asoka Subasinghe

**උපදේශක සංස්කාරක**
ජගත් ජේ එදිරිසිංහ Jagath J Edirisinghe

**සංස්කරණ සහය/Asst. Editors**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක**
අසෝක සිල්වා Asoka Silva

**සන්නස පිරිවර**

සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියාණි මද්දුමගේ
චන්ද්‍ර මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ
මේනකා ජයතිලක

**සේයා රූ**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

**පිටු සැකසුම සහ ග්‍රැෆික් නිර්මාණ**
**Page Layout & Graphic Designs**
සාමන්ත තැන්නගේ Saamantha Tennege
**Horizon** - Jagath J Edirisinghe

**සම්බන්ධීකරණය**

| **NSW** | **WA** |
|---|---|
| Lakshman Kodituwakku | Kapila Hemantha |
| 02 9626 7660 | Balage |
| 02 9837 5055 | 08 9456 1972 |
| **QLD** | **ACT** |
| Ananda Samaratunga | Asoka Nimalasiri |
| 07 3372 7953 | 0400 429 031 |
| **SA** | **TAS** |
| Chandra Eeriyagama | Anura Seneviratne |
| 08 8331 2318 | 03 6327 4259 |

Sannasa
61 Nettle Drive
Hallam Vic 3803 Australia
Web: www.sannasa.net
email : sannasanews@gmail.com
Tel/Fax : 03 9796 4241

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත.

CIRCULATION - 10000 COPIES IN AUSTRALIA

### සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය ඉතා කෙටියෙන් ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න.

## තවත් ජනපතිවරණයක්

තවත් ජනපතිවරණයක උණුසුම රටට දැනෙන්නට පටන්ගෙන තිබේ. ශ්‍රී ලංකාවේ පැවති ප්‍රථම ජනපතිවරණය මෙන්ම මෙවරද එය යොදාගෙන ඇත්තේ නියමිත කාලයට කලින් ය. ප්‍රධාන කරුණු දෙකක් නිසා මෙවර මැතිවරණය සුවිශේෂී වෙයි. සම්ප්‍රදායානුකූලව සිදුකෙරෙන අපේක්ෂකයන් දෙදෙනකු නොව එකම කණ්ඩායමක සිටි යුද්ධය නිසාම වීරයකු හා ශූරයකු අතර මෙන්ම දේශපාලනයට ප්‍රවීණයකු හා ආධුනිකයකු අතර වීම විශේෂයකි. එනිසාම මෙවර ජනාධිපතිවරණයට සූදානම් වන ජනතාවට වෙනදා මෙන් පුරුද්දට ඡන්දය පාවිච්චි කරනු වෙනුවට තම කැමැත්ත ගැන සිතීමට සිදුව තිබේ.

ඊට අමතරව එක් පක්ෂයක් හැර සියලුම පක්ෂ මේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම වෙනුවෙන් පෙනී සිටිති. අපට වැදගත් වන්නේ එයයි. ඉතිහාසයේ ප්‍රථම වතාවට මේ ක්‍රමය අහෝසි කිරීමට ජනතාව පෙළ ගැසීම ම මෙය රටේ ජනතාවට කෙතරම් බලපෑමක් කර ඇද්දැයි යන්න සනාථ කරවයි.

මේ විධායක ජනාධිපති ක්‍රමය සිංහල දෙමල මුස්ලිම් ආදී සියලු ජන කොටස් වෙත ඇති කෙරූ පීඩනය කොපමණ දැයි අපි අත්දැකීමෙන් දනිමු. දිගින් දිගටම ජනතාව වෙතින් මෙය අහෝසි කිරීමට උද්ඝෝෂණ මතු වුව ද අද වන විට බහුතර ජනතාවකගේ පොදු ඉල්ලීමක් බවට එය පත්කරනු ලැබ ඇත්තේ එම පීඩනයේ ප්‍රමාණය විසින්ය.

අපේක්ෂකයන් දෙදෙනාම කියන යුද්ධයට පසු ඇති කරන්නට බලාපොරොත්තු වන යහපත් ආර්ථිකයත් සමාජ ප්‍රජාතන්ත්‍රවාදයත් ස්ථාපිත කිරීම වැළැක්වීම සඳහා සෘජුව බලපාන්නේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම නොවන්නේ ද?

මේ ක්‍රමය පවත්නා තාක් කල් දූෂණය වංචාව රජ වී තිබෙනු ඇති බව නියත ය. පාලකයාගේ එහෙයියන් ආවඩන්නන් හා පාදඩයන් විසින් රටේ සම්පත් තොග ගණනින් සූරා කෑම වළක්වනු නොහැකිය. රට ඒකපාක්ෂික පාලන ක්‍රමයෙන් මුදවා ගැනීමෙන් තොර දූෂණයෙන් වංචාවෙන් හොරකමින් ප්‍රචන්ඩත්වයෙන් තොරව ජනතා අභිලාෂයන් ඉටු නොකර ඇති කළ හැකි ප්‍රජාතන්ත්‍රවාදයක් නැත. කිසිදු විවාදයකින් තොරව පෙළ ගැසිය යුත්තේ මේ ක්‍රමය අහෝසි කිරීමට සෘජුව සූදානම් වන අපේක්ෂකත්වය වටා මිස එය සුරකිමින් මෙයින් තව දුරටත් ජනතාව පීඩාවට පත්කිරීම සඳහා අරඅඳින්නට සූදානම් වන අප්ක්ෂකත්වය වටා නොවන බව අපේ වැටහීමයි. එනිසා මෙවර මැතිවරණයේදී ඔබේ ඡන්දය රටේ ඉදිරි අනාගතය සඳහා තීරණාත්මක ලෙස බලපාන තීන්දු ගන්නා අපේක්ෂකත්වය වෙනුවෙන් යොමු කළ යුතු යයි සිතමු.



# සරත් ද?

# මහින්ද ද?



# අප ද?

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, ජෙනරාල් සරත් ෆොන්සේකා මහතා, ජනාධිපති තරග බිමට ඇතුළු වනවාය යන ආරංචියත් සමඟ දේශපාලන පිටියේ මහත් වූ ආන්දෝලනයක් ඇති විය. මුලින් මුලින් ඔහු මෙම තරගයට ඇතුළු නොවනු ඇතැයි කියා කතා පැතිරිණ. නිලයෙන් ඉවත් නොවී, ඔහුට ඡන්දයකට ඉදිරිපත් විය නොහැකි යැයි පසුව කියැවිණි. ඊටත් පසුව පැමිනි අදහස වූයේ, ජෙනරාල්වරයා ඉල්ලා අස්වීමට ක්‍රියා කළත් ජනාධිපති වරයා විසින් ඉල්ලා අස්වීම භාර නොගතහොත් ඔහුට ජනාධිපති ඡන්දයට ඉදිරිපත් විය නොහැකි බවයි. ඒ අදහස් වලින් වූයේ ජනාධිපති වරයාගේ පෞරුෂය පලුදු වීමයි. ඒ නිසාම ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානිගේ ඉල්ලා අස්වීම භාරග ැනීමට ජනාධිපතිවරයාට සිදුවිය.

පසුගිය සති කිහිපය තුළ ජනාධිපති වරණයත් සරත් ෆොන්සේකා නම් පුද්ගලයා ගැනත් ඇති වූ කතාබහ විකාර ස්වරූපයක් ගත්තේය. මහින්ද හා සරත් යන දෙදෙනාම එකිනෙකා පරයා නැගෙන යුධ වීරයන් වීමත්, ඒ දෙදෙනාම වටා දේශප්‍රේමී ගුරුත්වය එම විකාර ස්වරූපය ඇති වීමට හේතුවිය. අර එක එක විකාර කතා කියන්නට පටන් ගත්තේ ජනාධිපති වරයා පරාජය වුවහොත් තම තමන්ගේ ඉරණමත් අනතුරේ වැටෙනු ඇතැයි කියා සිතුණු දේශප්‍රේමීහුය. අවසානයේ හමුදාපති වරයා තරගයට ඉදිරිපත් වන බව තහවුරුවිය. ඒ සමඟ විකාර දොඩවමින් සිටි අය තම පැරණි යුධ වීරයාට අවමන් කරන්නට පටන් ගත්තේය. වීරයා ද්‍රෝහියා විය. ඔවුන් ට අනුව සරත් ෆොන්සේකා මහතා මහින්ද රාජපක්ෂ මහතාට එරෙහිව සටන් වැදීම වැරදිය. මංත්‍රී හාමුදුරුවරුන් කිහිප නමක්, ඡන්දයට ඉදිරිපත් නොවන්නැයි කියා සරත් ෆොන්සේකා මහතාගෙන් ඉල්ලා සිටි බවට වාර්තා විය. ඉන් එක් පැවිද්දෙක්, තමන් මීට පෙර දේශපාලන තරග බිමට නොබසින්නැයි කියා, හිටපු හමුදාපතිවරයෙකු වූ ජානක පෙරේරා මහතාට අවවාද කළ බවත්, එය නෑසූ ඔහු ඊට ජීවිතයෙන් වන්දි ගෙවූ බවත්, පවසමින්, සරත් ෆොන්සේකා මහතාටද දේශපාලන තරග බිමට ඇතුළු නොවන්නැයි කියා අනතුරු ඇඟ වූයේය. හිටපු හමුදා නිලධාරියෙකුට ගිහියෙකු වශයෙන් මැතිවරණ දේශපාලනය නුසුදුසු වන්නේත් පැවිද්දන්ට දේශපාලනය සුදුසු වන්නේත් කෙසේදැයි පැහැදිලි නැත. අහෝ අපකිච්ඡ ප්‍රතිපදාව බහුකිච්ඡ ප්‍රතිපදාවට හැරිච්ච හැටි. නීති විශාරදයන්, උගතුන්, බුද්ධිමතුන් හා පඬිවරුන් ද අර භික්ෂූන් මෙන් ම මේ ප්‍රෙහේලිකාවේ පැටලී ව්‍යාකූලව ඔවුන්ගේ සැබෑ ස්වරූපයෙන් හෙවත් නිරුවතින් ඉන්නා සෙයකි. මේ ලිපියේ පරමාර්ථය වන්නේ අවධානයට ලක්විය යුතු කරුණු කිහිපයක් පමණක් එම සංවාදයට යොමු කිරීමය.

**ජනාධිපති තරගයකට ඉදිරිපත් වීමට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සලසා ඇති ප්‍රතිපාදන අනුව, සිවිල් පුරවැසියෙකු වී සිටින සරත් ෆොන්සේකා නම් පුරවැසියා එම තරගයට ඉදිරිපත් වීමේ වරද කුමක්ද? ඔහුගේ නුසුදුසුකම කුමක්ද? මේ පිළිබඳ වාමාංශික තර්ක ද රාජපක්ෂවාදී තර්කද සිවිල් සමාජවාදී තර්කද සංවර්ධනවාදී තර්කද අප ඉදිරියේ ඇත. අප මෙම තර්ක විමසා බැලිය යුත්තේ මේ තර්ක කරන්නන් එසේ කරන්නේ රටේ සුභසිද්ධිය වෙනුවෙන් ද නැද්ද සොයා බැලීමටය. රටේ අනාගතය වෙනුවෙන් වැදගත් වන්නේ ජයගත යුත්තේ කුමන පුද්ගලයාද යන්න නොව කුමන ප්‍රතිපත්තියද එය යථාර්ථවාදීද නැද්ද යන්නයි. ඉතිහාසය පුරා අප වරද්දාගත් තැන මෙතැනය.**

ප්‍රගීත් එක්නැලිගොඩ

ජනාධිපති තරගයකට ඉදිරිපත් වීමට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සලසා ඇති ප්‍රතිපාදන අනුව, සිවිල් පුරවැසියෙකු වී සිටින සරත් ෆොන්සේකා නම් පුරවැසියා එම තරගයට ඉදිරිපත් වීමේ වරද කුමක්ද? ඔහුගේ නුසුදුසුකම කුමක්ද? මේ පිළිබඳ වාමාංශික තර්ක ද රාජපක්ෂවාදී තර්කද සිවිල් සමාජවාදී තර්කද සංවර්ධනවාදී තර්කද අප ඉදිරියේ ඇත. අප මෙම තර්ක විමසා බැලිය යුත්තේ මේ තර්ක කරන්නන් එසේ කරන්නේ රටේ සුභසිද්ධිය වෙනුවෙන් ද නැද්ද සොයා බැලීමටය. රටේ අනාගතය වෙනුවෙන් වැදගත් වන්නේ ජයගත යුත්තේ කුමන පුද්ගලයාද යන්න නොව කුමන ප්‍රතිපත්තියද එය යථාර්ථවාදීද නැද්ද යන්නයි. ඉතිහාසය පුරා අප වරද්දාගත් තැන මෙතැනය. දැනට ඉදිරිපත්ව ඇති ඒ තර්ක හා ප්‍රවාද සියල්ලේම හරය මෙසේය.

(1) සරත් ෆොන්සේකා බලයට පත් වුවහොත් හමුදා ජුන්ටාවක් ගොඩනඟනු ඇත.

(2) හමුදා නිලධාරියෙකුට ප්‍රජාතන්ත්‍රවාදියෙකු වන්නට නොහැකිය.

(3) හොඳම හමුදා පාලකයාට වඩා නරකම දේශපාලන නායකයා හොඳය.

(4) රටක් දියුණුකිරීමට නම් ඒකාධිපති පාලකයෙකු අවශ්‍යය.

(1) සරත් ෆොන්සේකා හමුදා ජුන්ටාවක් ගොඩ නගනු ඇත යන අදහස උපකල්පනයකි. මේ උපකල්පනයේ පදනම ඔහු හමුදාවේ නායකයෙකු ලෙස සේවය කළ නිසාය.

45 වන පිටුවට